## සංක්ෂිප්තය

ඉගෙනුම් සමාජය නැමති සංකල්පය වර්තමානයේ ක්‍රියාත්මකව පවතියි. ඒ තුළ ගුරුවරයා විසින් ඉටු කරන ලබන භූමිකාව වෙනත් කවර දෙයකින් හෝ පූරණය කළ නොහැකි තත්ත්වයක පවතියි. පෙර පාසල් අවධියේ සිට උසස් අධ්‍යාපන මට්ටම දක්වා ම ගුරුවරයාට මහත් වූ සංකීර්ණතාවන්ට මුහුණ දෙමින් විවිධ වූ අභියෝග ඔස්සේ තම කාර්යයෙහි නියුක්ත වීමට සිදුව ඇත. මේ සඳහා අවශ්‍ය ශක්තිය ලබා ගත හැකි එක් ප්‍රබල හා සමීප කාර්යයක් වන ගුරු උපදේශක ක්‍රියාවලිය ආශ්‍රිතව ද පවතින්නේ සමාන සංකීර්ණත්වයකි. ඒ මගින් ගුරු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සිදුවන බලපෑම හා ඒවායේ ප්‍රතිඵල විවිධාකාර විය හැක. එනිසා ගුරු උපදේශක ක්‍රියාවලිය පිළිබඳව කෙරෙන ගැඹුරු අධ්‍යයනයකින් පවතින තත්ත්ව ගැන මැනවින් දැන ගැනීමටත් වඩාත් ඵලදායී තත්ත්ව ගොඩ නගා ගැනීමටත් හැකිවනු ඇත.

ප්‍රාථමික අංශයේ ගුරුවරුන්ගේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය කෙරෙහි ගුරු උපදේශක උපාධ්‍යයන ක්‍රියාවලිය බලපාන ආකාරය සොයා බැලීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය විය. මේ සඳහා ප්‍රාථමික ගුරු උපදේශක උපාධ්‍යයන ක්‍රියාවලිය, එයට අයත් සේවාස්ථ සැසි පැවැත්වීම, සහාය ඉගැන්වීම් සිදු කිරීම, ගුරුවරුන් සමග මනා සබඳතා පවත්වා ගැනීම හා ගුරු උපදේශක වෘත්තිය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. මේ සම්බන්ධව ගුරුවරුන් ගුරු උපදේශකවරුන් ඇතුළු අනිකුත් අදාළ පාර්ශ්වකරුවන්ගේ අදහස් ගැටලු හා යෝජනා විමසා බැලීම සඳහා ද අවධානය යොමු කරන ලදී.

විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ සිදු කරන ලද මෙම අධ්‍යයනය සඳහා සාහිත්‍යය විමර්ශනය, ප්‍රශ්නාවලි භාවිතය, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මගින් අදාළ තොරතුරු සපයා ගනු ලැබිණි. ශ්‍රී ලංකාවේ පාසල් වර්ගීකරණයට අයත් සියලු ම පාසල් වර්ග නියෝජනය වන පරිදි, අහඹු නියැදි ක්‍රමය යටතේ, බස්නාහිර පළාතේ පාසල් 40 ක් තෝරා ගැනිණි. එම පාසල්වල ප්‍රාථමික ප්‍රධාන අවධි තුන ම නියෝජනය වන සේ තෝරා ගනු ලැබූ ගුරුවරුන් 115 කට හා පළාතේ ප්‍රාථමික ගුරු උපදේශකවරුන් 99 දෙනෙකුට ප්‍රශ්නාවලි ලබා දී දත්ත සපයා ගැනිණි. මෙම ගුරු හා ගුරු උපදේශක නියැදිය අතරින් අහඹු ලෙස තෝරාගත් සියයට 10 දෙනෙකු සමඟත්, විදුහල්පතිවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, බස්නාහිර පළාත් ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ප්‍රධාන ප්‍රාථමික විෂය අධ්‍යක්ෂවරුන්, ජාතික අධ්‍යාපනායතනයේ

විෂයමාලා පුහුණුකරුවන් ආදී අනිකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟත් පවත්වනු ලැබූ සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගන්නා ලදී.

මේ ලබාගත් දත්ත තව දුරටත් තහවුරු කර ගැනීම සඳහා පර්යේෂකයා විසින් නිරීක්ෂණයෙහි යෙදෙන ලදී. මේ විවිධ ක්‍රම යටතේ ලබා ගන්නා ලද තොරතුරු විස්තරාත්මක සංඛ්‍යාලේඛන ක්‍රම භාවිත කරමින් විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණයේදී හා අර්ථකථනයේදී ප්‍රාථමික අංශයේ ගුරු ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට ප්‍රාථමික ගුරු උපදේශක උපාධ්‍යයන ක්‍රියාවලිය බලපානු ලබන බවත්, ප්‍රාථමික ගුරු උපදේශකවරුන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය පිරිසක් බව අදාළ පාර්ශ්වකරුවන් සියලු දෙනා ම විසින් පිළිගනු ලබන බවත් අනාවරණය විය. ගුරු උපදේශක ක්‍රියාවලියට ගුරුවරුන්ගේ මනා අනුකූලතාවක් ඇති බවත්, ගුරු උපදේශකවරුන් විසින් පවත්වනු ලබන සේවාස්ථ සැසි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට බෙහෙවින් බලපාන බවත්, ගුරු උපදේශකවරුන් විසින් පවත්වනු ලබන සේවාස්ථ සැසි සඳහා මනා ගුරු සහභාගිත්වයක් ඇති බවත් අනාවරණය විය.

එසේ වුවත් සේවාස්ථ සැසි පැවැත්වීම, සහාය ඉගැන්වීම් සිදු කිරීම, ගුරුවරයා අවබෝධ කර ගැනීම, පසු නිරීක්ෂණ සාකච්ඡා පැවැත්වීම ආදිය පිළිබඳ පුහුණුවක්, විෂය නිර්දේශ පුහුණුවලට අමතර ව ගුරු උපදේශකවරුන්ට ලබා දීමේ අවශ්‍යතාව පවතින බව තොරතුරු තුළින් හෙළි විය. සේවය ආරම්භයේදී ම ගුරු උපදේශකවරුන්ට උපාධ්‍යයන ක්‍රියාවලිය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීම යෝග්‍ය බව අදාළ පාර්ශ්වකරුවන් වැඩි දෙනෙකුගේම අදහස විය.

දනට කොට්ඨාසයකට නියමිත ව සිටින ප්‍රාථමික ගුරු උපදේශක සංඛ්‍යාව සහාය ඉගැන්වීම්හි යෙදීම සඳහා ප්‍රමාණවත් නොවන බවත්, ගුරු උපදේශකවරුන් පත් කිරීම ඔවුන්ට නියමිත කාර්යභාරය, ඔවුන් මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම, තෘප්තිමත් ව, අභිමානයකින් හා පෙළඹවීමකින් යුතු ව සේවය කළ හැකි පිරිසක් බවට පත් කිරීම හා අන්තර් සබඳතා පවත්වන ආකාරය ආදිය පිළිබඳ ගැටලු තත්ත්ව පවතින බව අනාවරණය විය.

විධිමත් ලෙස මෙම ක්‍රියාවලිය හැඩගස්වා ගැනීම, පවතින සම්පතකින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමකි. එමෙන් ම ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගුරු පෙළඹීම, ගුරු කැපවීම, ගුරු ක්‍රියාවලියේ ගුණාත්මක බව වර්ධනය, සිදු කරනු ලබන ප්‍රතිසංස්කරණමය වෙනස්කම් යාවත්කාලීන ව පවත්වා ගැනීම ආදී සංවර්ධනය විය යුතු අංශ යෝග්‍ය තත්ත්වවලට පත්කර

ගැනීමට හේතුවනු ඇත. ඒ සඳහා අවශ්‍ය පසුබිම සකසා ගැනීමට මෙම අධ්‍යයනයෙන් සිදු වූ අනාවරණ ප්‍රයෝජනවත් වනු ඇත.

ලොව නව ප්‍රවණතා පිළිබඳ නිරන්තර දැනුවත් වීමක් හා ඒ අනුව නිරන්තර හැඩ ගැසීමකට ගුරු උපදේශකවරුන්ව ලක් කිරීමේ වැදගත්කම ඉස්මතු විය. ගුරු උපදේශකවරුන් වෙත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනයට අදාළ නොවන කටයුතු පැවරීම අවම කර නියම උපාධ්‍යායකයින් පිරිසක් බවට පත් කිරීම අවශ්‍යය. ඒ තුළින් අවශ්‍ය මට්ටමේ ගුරු පිරිසක් හා මනා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කළ යුතුව හා සකස් කළ හැකිව ඇත.